අකුරණ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 16 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.2,237,773 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, රු.176,430 ක් වටිනාකම වූ යන්ත්‍ර සූත්‍ර හා රු.320,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතිය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පුස්තකාල පොත් ශේෂය තුළ රු.47,594 ක් වූ විනාශ කළ යුතු පොත් 685 ක් ඇතුළත්ව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,279,083 ක කර්මාන්ත ණයගැති ශේෂයක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැතියෝ එකතුව රු.7,789,600ක් වූ අතර, එම ශේෂයන් තුළ වර්ෂයට වැඩි කාලයක් ඉක්මවූ ණයගැති වටිනාකම රු.2,490,115 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.21,963,431 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,329,047 ක් ද වසර 3 ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.50,000 ක් ද විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 vii (ඊ) වගන්තිය | දැන්වීම් පුවරු වලින් රු.188,000 ක ආදායමක් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) (ආ) ඡේදය | වසර 2ක් ඉක්ම වූ රු.886,685 ක් වටිනා තැන්පතු 85 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත අදාළ කර ගැනීමට නිකුත් කර ඇති අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති ගැසට් පත්‍රයේ 4 (ආ) කොටසේ 20 (2) ඡේදය | යොමුගත නීති රීති වලට අනුකූල නොවී ප්‍රාදේශීය සභා බල ප්රදේශයේ මස්කඩ 24ක් පවත්වාගෙන ගොස් තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,921,846 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,037,958 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,883,888 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට වෙනත් ආධාර විෂයයේ රු.6,174,050 ක වැඩිවීමත් සමග වියදම් වැඩිවීම බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

2015 හා 2016 වර්ෂවල මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර අනුපාතය පිළිවෙලින් 2.5:1 සහ 2.1:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මස් අලෙවි කිරීමේ වෙළඳ අයිතිය සභාව සතුව තිබියදී, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෞද්ගලික මස් කඩ සඳහා බලපත්‍ර ලබා දී තිබුණි.

(ආ) සභාව සතු අංක LL 6410 දරන ඩ්‍රම් ට්‍රක් රථය හා බැකෝ යන්ත්‍රය 2014 ජූනි මාසයේදී සභාවට ලැබී තිබුණු අතර, මෙම සම්පත් වලින් ආදායම් වර්ධනය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.4.2 වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.1,635,375 ක හිඟ ශේෂයක් පැවතියද වර්ෂය තුළ ඉන් අයකර තිබුණේ රු.728,122 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 27 ක අගයක් විය.

2.4.3 බලපත්‍ර ගාස්තු

------------------

බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වර්ෂය ආරම්භයේ සමීක්ෂණයක් කර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,042,661 ක සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,288,650 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා කාර්යාලයේ වර්ග අඩි 1000 කින් පමණ යුතු පලමු මහල බදු දීමට හෝ අදායමක් ඉපයීමට කටයුතු නොකර ඉදිකල දින සිටම නිෂ්කාර්යව පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අකුරණ නගරයේ ස්ථාපිත, කඩ කාමර 35 කින් යුත් අකුරණ පොදු වෙළඳ සංකීර්ණය දැනට වසර 30 කට පෙර ඉදිකර ඇතත්, ඉදිකල දින සිටම අළුත්වැඩියා සහ නඩත්තු කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ලේ කඩ කාමර 4 ක් බදු දී නොතිබුණු අතර, බදු දුන් කඩ කාමර 10 ක් වසා දමා තිබුණි.

(ආ) අකුරණ මිනි මාර්කට්හි කඩ කාමර 9 කින් ඉතා අඩු තක්සේරු කුලියක් අයකර තිබුණි. එසේ වුවද, මෙම කඩ කාමර පිළිබඳව 2016 ඔක්තෝබර් 07 දින භෞතික විගණන පරීක්ෂාව අනුව අය කරන බදු කුලිය මෙන් සියයට 90 ක් පමණ වැඩි මුදලකට අතුරු බදු දී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

මස් විකිණීමේ අයිතිය බදුදීම සිදුකළ යුතු වුවත්, උපරිමය රු.3,333 ක් හා අවමය රු.1,670 ක බලපත්‍ර ගාස්තුවක් අයකර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික මස් කඩ 24 ක් පවත්වාගෙන යාමට අවස්ථාව සලසා දී තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

ප්‍රාදේශීය සභාව සතු වාහන 5 ක් ධාවන තත්වයේ නොපවතින අතර, එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

ප්‍රාදේශීය සභාව විසින් රජයේ ආයතනයක් ලෙස සලකා වයඹ සංවර්ධන අධිකාරියෙන් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර රු.690,000 ක වටිනාකම වූ මෘදුකාංග පද්ධතියක් මිලදීගෙන තිබුණි. මෙම ආයතනය සියයට 20 ක ලාභ ප්‍රතිශතයක් ලැබීමේ අරමුණින් අතරමැදි පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගතව මෙම ව්‍යාපෘතිය ඉටු කර ඇති බැවින් සභාවට උපරිම වාසි අත්වන ලෙස මෙම මිලදී ගැනීම සිදුවී නොතිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් නගාසිටුවීමේ වැඩසටහන යටතේ තලාකන්ද මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා රු.1,741,254 ක වියදම් දරා තිබුණි. කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එහි කොන්දේසි වලට අනුව සිදුකර නොතිබුණු අතර, ටෙන්ඩර් මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් පරිදි ටෙන්ඩර් මණ්ඩලය පත්කර නොතිබුණි. ටෙන්ඩර්කරුවන් 13 කට ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර යවා ඇතත්, එක් පුද්ගලයකු පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කර තිබුණි. වැඩ විෂයය අංක 3 මඟින් කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා ඝන මීටරයකට රු.13,435 බැඟින් ගෙවා ඇතත්, පතුලේ ඝනකම මි.මී. 10 ක් වශයෙන් දක්වා තිබුණද 2017 මාර්තු 23 දින භෞතික පරීක්ෂාවේදී මි.මී.5 ක් වූ බැවින් කාණුවේ දිග මීටර 32 ක් සඳහා රු.15,041 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ප්‍රතිපාදන මත වූ කර්මාන්ත සඳහා 2016 පෙබවාරි 21 දිනැති හා අංක 1/2016 දරන ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ චක්‍රලේඛයේ 4:1 ඡේදය ප්‍රකාරව අනුමත මිල ගණන් තුළ ලාභය ඉවත් කර ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර, යථෝක්ත චක්‍රලේඛයේ 3 වගන්තියෙන් පරිබාහිරව සභා කාර්යාලයට තීන්ත ආලේප කිරීම සඳහා රු.108,675 ක වියදමක් දරා තිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතුවන සම්පූර්ණ කසළ ප්‍රමාණයම එකතු නොකරන අතර දිනකට කසල ටොන් 5 ක පමණ ප්‍රමාණයක් එකතු කර යාළුගහවෙල කොම්පෝස්ට් අංගනය වෙත රැගෙන ගොස් නොදිරන කසල සුළු ප්‍රමාණයක් කසල අංගනයේම එක් පසෙකින් ගිනි තබා තිබුණි. යාළුගහවෙල කසල අංගනය නාය යාමත් සමඟ එහි තිබූ අප ජලය ඉවත් වන කානු වැසී තිබූ අතර, 2016 ඔක්තෝබර් 04 දින වන විටත් එම අංගනය නිසි පරිදි අළුත්වැඩියා නොකිරීම නිසා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට ගැටළුකාරී තත්වයක් වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 8 ක ඇස්තමේන්තුගත වියදම ඉක්මවා සියයට 1 සිට සියයට 57ක් දක්වා වියදම් දරා තිබුණි.

(ආ) කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළින් ආදායම් උත්පාදනය වැඩිකර ගැනීමට අදහස් කළද, කොම්පෝස්ට් අලෙවි කිරීම සඳහා නව ආයෝජකයින් සොයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
-------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(ඊ) කොන්ත්‍රාත් පාලනය

(උ) මිලදී ගැනීම්